# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1838/6 - 2013 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2013.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ(2) වගන්තිය යටතේ නුවරඑළිය මහ නගර සභාවේ සභිකයෙකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මධ්‍යම පළාතේ පළාත් සභාවට තේරී පත් වීම හේතු කොට ගෙන නුවරඑළිය මහ නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

රාධක්‍රිෂ්නම් රාජාරාම් නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ නුවරඑළිය මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තතු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන මාරි රාමනාදන් බාලක්‍රිෂ්ණන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරණු ලැබ ඇති හෙයින් ද ;

නුවරඑළිය මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී හෙට්ටියාකන්දගේ අරුණපුෂ්ප සෞම්‍යසිරි ප්‍රනාන්දු වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මාරි රාමනාදන් බාලක්‍රිෂ්ණන් මහතා නුවරඑළිය මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

හෙ. අ. සෞ. ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරි,
නුවරඑළිය මහ නගර සභාව.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

12 - 377


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 18596 — 165 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*